# 3 චිචෙං චුලංගෙං යමු කිරි නෑනෝ

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ලෙස සැලකෙන්නේ අතීතයේ සිට අප රටේ විසූ වැදි ජනයා ය. ඉන්දියාවේ සිට පැමිණි විජය කුමරුගේ සහ ඒ අවදියේ ලංකාවේ විසූ කුවේණි නැමැති යක්ෂ ගෝත්‍රික කුමාරියගේ දරුවන් ජීවහත්ථ හා දිසාලා යන දෙදෙනාගෙන් වැදි ජනයා පැවත එන බව බොහෝ දෙනාගේ අදහස වෙයි. විසි වන සියවස ආරම්භය තෙක් ම මුළුමනින් ම වනගත ජීවිතයක් ගත කළ වැදි ජනයා මේ වන විට අසල් වැසි සිංහල හා දෙමළ ගම්වල ජනයා හා මිශ්‍ර වී ඔවුන්ගේ සමාජ චාරිත්‍ර හා ජීවන රටා අනුගමනයෙන් වෙනස් වීම්වලට ලක් ව ඇත. වැදි ජනයා පිළිබඳව ඩී. ජී. සෙලිග්මාන් හා බ්රෙන්ඩා සෙලිග්මාන් යන විදේශීය විද්වතුන් මෙන් ම නන්දදේව විජේසේකර, පී.බී. මීගස්කුඹුර යන දේශීය විද්වතුන් ද පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියා ඇත. ආර්.එල්. ස්පිට්ල් වෛද්‍යවරයා වැදි ජනයා හා වෙසෙමින් ලත් අත්දැකීම් නිර්මාණාත්මක ප්‍රබන්ධ ස්වරූපයෙන් ලියා තැබී ය. මේ පරිච්ඡේදය වෛද්‍ය ආර්. එල්. ස්පිට්ල් ලියූ Vanished Trails කෘතියේ සිංහල පරිවර්තනය වන මැකී ගිය දඩමං කෘතියෙන් (පරිවර්තක ඒ.පී. ගුණරත්න) උපුටා ගත්තකි.

...බිබිලේ මඩකලපුව අතර පැරණි වැදි රට වශයෙන් හැඳින්වුණ කොටසේ වර්ග කීපයක වැද්දන්ගෙන් මිශ්‍ර ව දැනට ඉතිරි ව සිටින ටිකදෙනා වූ මේ වැද්දෝ මෙතෙක් විසූ ගල් ගෙය හැර මඟට බැස්සෝ ය. ආරක්ෂා විරහිත නිර්භීත දක්ෂ මේ කුඩා පිරිසේ එක ම ආරක්ෂක ආයුධය වූයේ ඔවුන්ගේ ම දෛවය යි.

දිවයිනේ අනිකුත් මිනිසුන්ට අතීත කතාවක් පමණක් වූ මිනිස් සංහතියේ අතපල්ලෙන් වැටුණ මේ වැදි පිරිසේ දර්ශනය ඉතා දිළිඳු එකක් වී ය. මේ මුළු පිරිසේ ම ඇඳුම් එකට එක් කළ විට සාමාන්‍ය කැලෑබද ගමක එක් මිනිසකු අඳින තරමේ රෙදි පිළි එහි නොවී ය. මේ කඩමාලු කැබලි ඉණ දවටා ගත් මොවුන්ගේ ශරීර උණුසුම් ව තබා ගැනීමට ශීතල රාත්‍රී කාලවල දී ඔවුන්ට ලැබුණේ අවුළුවා ගත් ගිනි මැලයේ උණුසුම ම පමණකි.

මේ මුළු පිරිසේ ම ආරක්ෂාවට හා ආහාර සපයා ගැනීමටත් ඔවුන් අතර ආයුධ

වශයෙන් තිබුණේ පොරමොලාගේ දුන්න හා ඊතල හයත් - මේ ඊතලයක් විද හැරිය විට මොන වෙහෙසක් දරා හෝ නැවත සොයා ගනී - පොරවත්, දැන් කයිරා හා ගමා ද ආඩම්බරයෙන් කර ගන්නා ගෙන යන ඩොන්ගා හා වේලා ද සතු ව තුබුණ පොරෝ කෙටි දෙකක් පමණකි. මොවුන්ගේ ප්‍රධාන ආරක්ෂා විධි වූයේ නපුරු සතුන් හමු වූ විට සමූහ වශයෙන් වේගයෙන් කෑ ගෑම හා මන්ත්‍ර කියා කෑ ගෑමත් වලසුන් වැනි සතුන් පහර දෙන්ට එන විට ගස්වලට නැග ගැනීමත් පමණකි. වැද්දන් ගල් ගෙය හැර යන මේ සමයේ වන පෙදෙසට ඉඩවරය පවතින, එහෙයින් ම වන සතුන් දඩයමේ යෙදෙන කාලය යි. තම පිරිසේ වාසයට තැනක් සොයා යාමට වඩා වනයේ ප්‍රමාද වෙමින් යාමට පොරමොලා ඉටා ගත්තේ එහෙයිනි. මොවුන්ගේ පිරිසේ වැඩි දෙනා කුඩා ළමයින් වූ හෙයින් පිරිසේ ගමන ඉතා සෙමින් වී ය. මුල් දවසේ සැතපුමකට වඩා දුර ගමන් කළේ නැත. බලන තලාව පසු කළ පිරිස තොට ඔයේ අත්තක් වූ කරඳැත්තෙ ඇළ ඉවුරේ වැලිතලාවට පිවිසියේ ය. මෙතැන තාවකාලික නැවතීමකට ඉතා සුදුසු දර්ශනීය ස්ථානයක් වී ය. මෙහි වූ ගල්මැදේවළ නම් දිය වළ මේ නම ලැබුවේ එය විශාල ගල් දෙකක් අතර පිහිටා තිබීම නිසා ය. ගල්මැදේවළ දිය කඩිති දෙකකින් යුක්ත විය. මෙහි කුඩා මසුන් පෙරළෙමින් සිටිනු දක්නට ලැබීම වැද්දන්ගේ සතුටට හේතු විය. මැදි දවල් සැඬ හිරු රැසින් ගල රත් වී එයින් ගල අසල ම වූ කුඩා දිය වළේ දිය ද රත් ව තුබුණ හෙයින් එහි වූ කුඩමස්සු කිසියම් ඉවකින් සිහිල් දිය ඇති ගැඹුරු දිය වළක් නුදුරින් ඇති බව දැන එයට පැන ගන්නා අදහසින් දිය කඩිති දෙක අතර වූ අඩි හතරක් පමණ වූ ගල්තල්ලය මතට වරින් වරට පැන්නෝ ය. මෙයින් වැඩි හරියක් කුඩමසුන් උණුසුම් ගල් තලයේ එහා මෙහා පැන මිය ගිය අතර තවත් සමහරෙක් ආපසු තමා හුන් දිය කඩට ම පැන ගත්තෝ ය. වඩා වාසනාවත් ටික දෙනෙක් පමණක් බලාපොරොත්තු වූ පරිදි මහ දිය වළට පැන ගත්තෝ ය.

මොහොතක් වෙලා දිය වළ දෙස බලා සිටි පොරමොලා ගමා හා කයිරා අමතා "ගමා, කයිරා මේ කුඩමසුන්ට වහ තලාපියව්" යයි කීවේ ය. ඔවුන් මැලිකම් පානු දුටු හේ "හනික, හනික, බලා ඉන්ට කල් නෑ. අප හැම ම බඩගින්නේ" යයි ඔවුන් උනන්දු කළේ ය...

..."වරෙන් කයිරා" කියමින් ගමා ඉස්සර වී වනය දෙසට යන්ට වූ අතර පොරමොලා කහට පොතු විටක් සැපීමට ඇළ ඉවුරේ ඇණ බා ගත්තේ ය.

වනයට ගිය කොල්ලෝ ටික වේලාවකින් ම ආපසු පැමිණියෝ ය. ඔවුන් දෙදෙනා අත ම රියනක් පමණ දිග අත්දණ්ඩක් පමණ මහත වැල් කැබැල්ලෙක්

බැගින් වී ය. මේ පුස්වැල් කැබලි ය. ගෙනා වැල් කැබලි ගල මත තබා පොරෝ බන්දෙන් තැළූ ඔවුහු ඒවා දියට බහා කලතන්ට වූහ. සබන් පෙණ වැනි පෙණ බුබුළු එයින් මතු වන්ට වී ය. නැවත නැවත මේ වැල් කැබලි ගලේ ගසමින් දියෙහි කැලතූ ඔවුහු කුඩා මසුන් මත් වී දිය මත පෙරළෙන තුරු බලා සිටියහ. ටික වේලාවකින් මත් වූ කුඩමස්සු දියේ පා වෙන්ට වූහ. එහෙත් බලාපොරොත්තු වූ තරම කුඩමසුන් ඔවුන්ට නොලැබිණි.

"මේක එක කටකටත් මදිනේ? මොකද කරන්නෙ?" පොරමොලා මසුන් දෙස බලා කීවේ ය.

"අපට කුකුරුමුවන් ගෙඩි ටිකක් කඩා ගන්ට ඇත්නම්!" කයිරා සුසුම් ලෑවේ ය.

"එහෙනම් ගිහින් හොයාගෙන වරෙල්ලා. අපි මෙහෙම ඉන්නම්." කොල්ලෝ නැවත වනයට ගියෝ ය.

වැඩි වේලා නොගොස් ම ඔවුන්ට කුකුරුමුවන් ගසක් හමු විය. පේර ගෙඩි මෙන් හැඩය හා මහත ද ඇති ඉදී කහ පැහැ ව ගිය මේ ගෙඩි හුඟක් පොලුවලින් ගසා කඩා ගත් වැදි පැටවු දෙදෙනා ආපසු දිය වළ කරා අවුත් මේ ගෙඩි තළා දිය වළේ දමා කලතන්ට වූහ. මේ වර ඔවුන්ට වැඩි වේලාවක් බලා සිටින්ට නොවී ය. ලොකු ලොකු කුඩමස්සු රැන් රැන් මත් වී උඩ මතු වී බඩපැත්ත පෙරළී පා වෙන්ට වූහ. මෙහි දී ඔවුන්ට මසුන් රාශියක් අල්ලා ගත හැකි වූ නමුත් ජාති කීපයකට අයත් වූ මේ මස්සු අඟල් තුන හතරකට වඩා දිග නොවන කටු බහුල මස්සු වූහ. සුදහ ගින්දරේ පසු වන වැද්දන්ගේ බඩට වුවමනා කරන්නේ රසයට වඩා ආහාර ප්‍රමාණය වන හෙයින් එය ඔවුන්ට හොඳ ආහාරයක් විය.

කොලුපැංචන් කුඩමසුන්ට වහ තළන අතර තනි ව වනයට ගිය පොරමොලා මී වද දෙකකුත් මැරූ තලගොයෙකුත් දැතින් ගෙන ආපසු පැමිණියේ කොල්ලන් කර තිබුණ සමත්කම ගැන ඔවුන් පැසසුවේ ය.

දින දෙකක් මෙතැන නැවතී සිටි මොවුහු ඇළ දිගේ ගමන් කොට මේ ඇළ තොට ඔයට සම්බන්ධ වන තැනට පැමිණියෝ ය. බොඩගහ වළ නමින් දන්නා මහ දිය වළක් මේ ඔය ඉවුරේ විය. මෙතැන කලින් තුබුණ විශාල බොඩගහක් නිසා දිය වළට මේ නම් ඇති ව තුබූ නමුත් ඒ මහ ගහ මෙවිට එහි නොවී ය. කලකට පෙර මැරී ගිය ඒ ගහ වෙනුවට උසට වැටුණ කුඹුක් ගහක් හා ඇටඹ ගහක් ද මෙහි විය...

...ඔය ඉවුරේ බොරළු සහිත බිමෙහි ගැහැනුන් සහ ළමයින් ද රැඳ වූ පොරමොලා දියකඩේ අනතුරුදායක කොටස දෙසට නොයන ලෙස

ඔවුන්ට අවවාද කොට ගමා හා කයිරා ද කැටුව වනයට ගියේ ය. මේ දියවළ ගැඹුරු ය. ලොකු මස්සු ද බොහෝ වෙති. එහෙයින් පුස්වැල් හෝ කුකුරුමුවන් ගෙඩි හෝ තළා දැමීම ප්‍රමාණවත් නොවේ. මෙහි කුඩමසුන් මත් කිරීමට වඩා සැර දෙයක් අවශ්‍ය ය. එසේ ම බාගයට මත් වී උඩ පීනන ලොකු මසුන් විද මරා ගැනීමට කුඩා දුනු හී ද අවශ්‍ය වෙයි. මොවුන් මේ වනයට ගියේ එකී දේ සපයා ගෙන ඒමට ය.

පළමුකොට ම ඔවුහු දුනු හීවලට වුවමනා කරන උල්කෙන්ද හෝ ගැටවැල් සොයා ගියෝ ය. ඒවායින් දුනු හී දෙක ම තනා ගැනීමට ඔවුන්ට හැකි වෙයි. කෝටු කපා ඊතලමුණෙන් සැස සිහින්කර ඊ තනා ගන්නා ලදි. ගමා හා කයිරා ද පොරමොලාගේ දක්ෂකම් පරදවන්ට මෙන් අනලස් ව ක්‍රියාශීලී ව මේ වැඩේ යෙදුණෝ ය. දුනු ලී පහක් කපා නුග අරළු පට්ටාවලින් තැනූ දුනුදියෙන් ගැට ගසන ලදි - පිහාටු නැති ඊ දඬු දොළහක් උල් කොට තනා ගන්නා ලදි. විත් කෑ මසකු ඊයත් ඇද ගෙන ගැඹුරට ගිය හොත් උඟ ඇද ගැනීම පිණිස එක එක ඊ ගස කෙළවරේ දිග පට්ටා ලනුවක් ගැට ගසා එය දුනු කෙළවරට සම්බන්ධ කරන ලදි. ළඟක සිට වුව ද සෙලවෙන යමක් කෙරේ නොවැරදී විදීමට පුහුණුවක් අවශ්‍ය ය. මේ අවශ්‍ය පුහුණුව ගමාට හා කයිරාට ද ලබා දෙන පොරමොලා කුඩමසකු වෙනුවට එල්වූ කොළයකට එල්ලය බලා විදීමට පුහුණු කරවූයේ ය.

කුඩමසුන් මත් කරවන බෙහෙත සඳහා ගල් අතර වැවෙන දළුක් ගස් සොයා සැතපුම් දෙකක පමණ දුරක් ගමන් කිරීමට ඔවුන්ට සිදු විය. කිරි ගැනීම සඳහා ඔවුන් විසින් කළ යුතු ව තුබුණේ දළුක් ගසේ පොත්ත කීප පළකින් කපා යටින් ලබු කැටය අල්ලා සිටීම පමණකි. කිරිවලින් පොහොසත් දළුක් ගස මෙසේ කැපූ විට උල්පතකින් දිය එන්නාක් මෙන් දිගට ම කිරි වෑස්සෙයි. කීප වරක් මෙසේ කිරීමෙන් දළුක් කිරෙන් ලබු කැටය පුරවා ගැනීමට වැඩි වේලාවක් ගත නොවේ.

මොවුන් මසුන් මත් කරවීමට යන මේ දිය වළේ එක් පැත්තකින් දිය පිට වී ගලා යන හෙයින් ඔවුන් දමන මත් ද්‍රව්‍යය එතැනින් පිට ව නොයන සේ ඇවිරිය යුතු විය. වඩා ගැඹුරු නැති කොටස වැලි සූරා රොක් කර වැටියක් බැඳ ගැනීමෙන් එසේ කළ හැකි විය. එහෙත් එහි මඳක් ගැඹුරු කොටසේ ඉනි සිටුවා අතුරිකිලි දමා වැටියක් බැඳීමට ඔවුන්ට සිදු විය.

මේ සියලු කටයුතු බවට වූ පසු පොරමොලා දළුක් කිරි පිරවූ ලබු කැටය අතින් ගෙන වළ වටා යමින් එය දිය මතුපිට ඉහිරවන්ට වී ය. දිය මතුපිට වූ අඳුරු නිල් පැහැය කිරි පැහැ විය. එයින් පසු ඔවුහු හැම දෙන දුනු හී ගෙන

දණමතක් දියට බැස මත්වීමට පෙර පැන යන මසුන් රැකීමට තැන් තැන්වල සිටගත්හ. මුලින් ම වස මිශ්‍රණයේ ඉව දැනුණ කටු පෙතියෝ වළෙන් පැන දිය පහර දිගේ යන්ට උත්සහ ගනිමින් දියෙන් පැන්නෝ ය. එහෙත් කොළ අතුවැටිය උඩ වැටුණු මේ මස්සු ආපසු දියවළට ම පැන්නෝ ය. සමහර කුඩමස්සු වැල්ලෙන් කළ කුඩා වැටිය පැන පහසුවෙන් ගැළවී ගියහ. සුදු පාට බඩ ඇති එක් කටුපෙති වර්ගයකගේ පැන යාමට බාධා නොකළේ මිනිසුන්ට විෂ ඇති මකුළුගෙඩි කෑමට ප්‍රිය කරන මේ මසුන් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු හෙයිනි.

පොරමොලාගේ බිරිඳ වූ කළු‍ෑ ද දුනුවායන්ට එක් වූ නමුත් ඩොන්ගාගේ වැන්දඹුව වැලිවැටියෙන් දිය බැස යාමට තැනක් කඩා හැර එතැන දණ ගසාගෙන තමා හැඳගෙන හුන් කුඩා රෙදිකඩ අවුරා එතැනින් පැන යන්ට ආ කුඩා මසුන් රැසක් ම එකතු කර ගත්තී ය. විෂ ඇති පෙටියන් ඈ වටා පැන ගිය නමුත් ඕ තොමෝ ඔවුන් ගණනකට නොගත්තා ය.

මේ අතර පොරමොලා හා කොලු පැටවු දෙදෙනා ද දුනු අතින් ගෙන මත් වී එහා මෙහා පීනන මසුන් විදීම පටන් ගත්හ. පොරමොලාගේ ඊයක් වැරදී ගියේ කලාතුරකිනි. හේ එක මසකු ඊයෙන් මුදා ඉණ බැඳ ගෙන සිටි වැල්පටේ අමුණා ඉවර වනවාත් සමග ම තවකකු විද්දේ ය. ගමා හෝ කයිරා හෝ එසේ මසුන් විදීමට සමත් නොවූහ. ඔවුන්ගේ ඉලක්කය වැරදී ගියේ ය. පසුව පොරමොලා ඔවුන් දෙදෙනා තමන් ළඟට කැඳවා තමා විදින හැටි හා ඉලක්කය නොවැරදී ගන්නා සැටි ද පෙන්වා දුන්නේ ය.

හැම විට ම අනිකාට වඩා දක්ෂයකු වූ ගමා මුලින් ම ලොකු මසකු විද්දේ ය. තමා විද හැරිය ඊය වැල්ලේ ඇනෙනු වෙනුවට දිය රැළි අතර කුඹ ගසක් මෙන් කෙලින් සිට නටා යනු දුටු ගමා එහි කෙළවරට ගැට ගසා තුබුණ පට්ටා ලනුවෙන් ඇද එය මෑත් කොට ගත්තේ ය. එය ලොකු ලූලකුගේ ඇඟෙහි ඇමිණී තිබිණි. ලූලා ඉතා ම රසවත් කුඩමස්සා වෙයි. ගමා ප්‍රීතියෙන් කෑ ගැවේ ය. අනික් වැද්දෝ ගමා හා එකතු ව ප්‍රීතිය ප්‍රකාශ කිරීමට කෑ ගැවෝ ය. කයිරාට අත හුරු කර ගැනීම ප්‍රමාද විය. එහෙත් හවස් වන විට කළු‍ෑ මෙන් ම කයිරා ද වැල්ලේ ගොඩ ගැසී තුබුණ කුඩමසුන් ගොඩ තර කිරීමට උපකාර වූවෝ ය.

මෙහි දී අල්ලා ගත් මස්සු අඟල් හයක් අටක් දික් වූයෙන් ගල්මැදේ කුඩා වළෙන් ඇල්ලූ මසුන් මෙන් ප්‍රමාණයෙන් දෙගුණයක් පමණ ලොකු වූහ. එහෙත් දිය කඩිති දෙකේ දී ම අල්ලා ගනු ලැබුවේ එක ම වර්ගවල මස්සු ය. මෙහි වූ මසුන් අතර ලූල්ලු හා හිරිකණයෝ ද රසවත් මස්සු වූහ. පෙටියෝ,

කාවයියෝ, දණ්ඩි, හුංගෝ, මගුරෝ, ආන්දූ, කොළකණයි හා තිත්තයෝ ද එහි සිටියහ. ලංකාවේ මිරිදිය කඩවල වසන කොයි වර්ගයේ කුඩමස්සුත් මේ ගැඹුරු දිය කඩේ විසුවෝ ය. ගංවතුරක් ආ විට මොවුහු වළෙන් පිට වී දිය පහරත් සමග වෙනත් තැන් කරා යති.

එදා අසු වූ මසුන්ගෙන් කොටසක් ලුණු මිරිස් හා කොළවර්ග ද දමා තම්බා කෑ ඔවුහු ඉතිරි මසුන් ගොඩ කුඩා මැසිපිට තබා මඳ ගින්නේ වියළා ගත්තෝ ය.

පසුව දා උදයේ මේ දිය වළේ මැරී පාවෙමින් සිටි කුඩා මසුන් ඉතා ටික දෙනකු හැරුණ විට දියවළට වහ තළා දැමූ බවට අනික් කිසි ම ලකුණක් එහි නොවී ය. ගැඹුරේ සිටින ලොකු මසුන්ට කිසි ම හිරිහැරයක් සිදු වී නොමැත. එතෙක් නොව ඉතා කුඩා මසුන් ද නොගැඹුරු දියේ එහා මෙහා පීනමින් රංචු ගැසී සිටිනු දකින්නට ලැබීම පුදුම සහිත කරුණක් වී ය.

අල්ලා ගත් මසුන් හා අල ද වෙනස් වෙනස් ලෙස පිළියෙල කොට කමින් වැද්දෝ මෙතැන දින තුනක් ගත කළෝ ය. ජීවත් වීමේ ස්ථිර පදනමක් නැති ව සිටිනා නිසා මොහොතකට අතීත ජීවිතය සිහියට එන නමුත් දැන් නැවතත් ඔවුහු පසුගිය දා වූ දුක් කරදර අමතක කර දැමූ, ප්‍රීතිමත් පවුලක වැද්දෝ වූහ.

බොඩගහ වළ අනතුරුදායක තැනකි. ගැඹුරේ සැඟවී සිටින කිඹුලුන් හැරුණ විට මේ අහලක මේ කාලයට අනික් දිය වළක් ඉතිරි ව නැති හෙයින් රාත්‍රී කාලයේ හැම වර්ගයක ම වනසත්තු දිය බීමට මෙහි පැමිණෙති.

මහවනය රාත්‍රී කාලයේ ශාන්ත හෝ නිශ්චල හෝ නොවේ. කලබල සහිත ය. දවාලට වඩා බියකරු ය. එහෙයින් මේ පිරිස හැසිරුණු කොතැනක දී වුවත් හැන්දෑ යාමය ළං වන විට නෑ යකුන්ට යාදිනි කියන පොරමොලාගේ කට හඬ වනයේ රැව් දෙන්ට විය.

රාත්‍රී කාලයේ දී වරින් වර ගිනි මැලය අවුළුවමින් හා වනයේ වියළි පරඬලා තැළෙන හඬ ඇසෙන විට අඬහැර පාමින් ද පොරමොලා බොහෝ වේලා නොනිදා ගත කළේ ය. සමහර විට මේ ශබ්දයන් අහිංසක ඉත්තෑවකු වැනි සතකු නිසා ඇති වෙයි. දියකඩේ එහා කෙළවරින් දිය බීමට එන දිවියා එන්නේ නිශ්ශබ්ද ව නොදැනෙන සේ ය. හඳ ඇති එක් රැයක කුඩා ඇත් රැළක් එහි පැමිණ පොරමොලාගේ අඬ තැළීම ගණනකට නොගෙන දියවළෙහි ලැග සිටියේ ය. දැන් මෙතැන හැර යා යුතු වෙලාව යයි එවිට පොරමොලා සිතා ගත්තේ ය."





වැදි ජනයා විටෙක බිරිඳ මෙන් ම දරුවන් ද සමග දඩයමේ යති. මෙහි දැක්වෙන්නේ පාන්දරින් දඩයමේ යෑමට සූදානම් වන වැදි පුරුෂයා සිය බිරිඳ අවදි කරවා කියන ගීතයකි. නන්දදේව විජේසේකර මහතාගේ වැද්දන්ගේ විකාශන ක්‍රමය කෘතියෙන් එය උපුටා ගන්නා ලදි.

තෙන තෙදිනා නා තෙදිනා නේ බල //
චප්පී චලපිලි කියන කාට //
එලිවිලි පංචිල වැන්නව් නෑනේ//
යන්නට නිදි කිමිදිය කිරි නෑනේ//
උඩෙං යන්නත් බොල් පිනි බැරි නං //
බිමෙං යන්නත් බොල් පිනි බැරි නං
දුන්න පිලාවට වර කිරි නෑනේ//
දුන්න පිලාවේ යන්නත් බැරි නං//
ඊතල් අවුරට වර කිරි නෑනේ//
ඊතල් අවුරේ යන්නත් බැරි නං //
චිචෙං චුලංගෙං යමු කිරි නෑනේ //

මේ වැදි ජන ගීයෙහි අර්ථය පහත පරිදි දැක්විය හැකි ය.

තෙන තෙදිනා ....//
එළි වෙලා පහන් වෙලා වගෙයි //
ගමන යන්නට නින්දෙන් අවදි වී එන්න //
බොල් පිනි නිසා උඩිං යන්ටත් බැරි නම්//
බොල් පිනි නිසා බිමින් යන්ටත් බැරි නම්//
දුන්න පිලාවට එන්න//
දුන්න පිලාවේ යන්න බැරි නම් ඊතල අහුරට එන්න//
ඊතල අහුරේ යන්ටත් බැරි නම් සීතල සුළඟේ පහස විඳිමින් යමු //

## අවබෝධය

1. වැද්දන්ගේ දිළිඳු බව වඩාත් හොඳින් කියැවෙන පාඨය උපුටා දක්වන්න.
2. ගල් මැදේවෙළ හා බොඩගහවළ දිය වළවල්වලට එම නම් ලැබීමට හේතු පහදන්න.
3. කුඩමස්සු අල්ලා ගැනීමට වැද්දන් යෙදූ උපක්‍රම මොනවා ද?
4. කුඩමසුන්ට අමතරව ඔවුන් එකතු කරගත් වෙනත් ආහාර වර්ග මොනවා ද?
5. ඔවුන් නතර වී සිටි ස්ථානයෙන් ඉවත් වී යාම සුදුසු බව පොරමොලා තීරණය කළේ කුමක් නිසා ද?

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් පද වලට සමානාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.**
   - i. බඩගින්න -
   - ii. සාමූහිකව -
   - iii. භායානක -
   - iv. සමීපයට -
   - v. උදෑසන -
2. **පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.**
   - i. දිළිඳු -
   - ii. උණුසුම -
   - iii. ගැඹුරු -
   - iv. නිශ්චල -
   - v. ප්‍රීතිය -

## ප්‍රායෝගික අභ්‍යාස

1. **වැදි ජනයා පිළිබඳ පොත් පිංචක් සකසන්න.**
2. **වැදි ජන ගීය සාමූහික ව ගායනා කරන්න.**
3. **පහත ලබා දී ඇති මාතෘකා අතරින් එකක් පිළිබඳ වාක්‍ය රචනයක් ලියන්න.**
   - i. වැද්දන්ගේ ජීවන රටාව
   - ii. විවිධ ජන කොටස්වල සිරිත් විරිත්
   - iii. ස්වාභාවික පරිසරය හා බැඳුණු ආදිවාසීහු

## මාතෘකානුකූල කතා

නිශ්චිත මාතෘකාවට අනුකූල වන පරිදි කතාවක් පැවැත්වීම මාතෘකානුකූල කතා ලෙස හඳුන්වයි. තමන්ට ලබා දී ඇති මාතෘකාව නිරවුල් ව සහ පරිපූර්ණ ව අවබෝධ කර ගැනීම මාතෘකානුකූල කතාවක් මැනවින් සංවිධානය කර ගැනීම එහි සාර්ථකත්වය සඳහා වැදගත් වේ. එහි දී මාතෘකාවේ සෑම අංශයක් කෙරෙහි ම අවධානය යොමු කළ යුතු ය. කතාවේ මුල මැද සහ අග මැනවින් සංවිධානය කර ගැනීම කතාවක සාර්ථකත්වයට බෙහෙවින් බලපායි.

1. විවිධ ජන කොටස්වල චාරිත්‍ර වාරිත්‍ර
2. පරිසර හිතකාමී ජීවන රටාවකට හුරු වීමේ වැදගත්කම
3. උගතමනා ශිල්පයමයි - මතු රැකෙනා
4. ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට
5. කියවීමේ අගය

## සුබ පැතුම් පත්

සුබ පැතීම හෙවත් සෙත් පැතීම සඳහා මෙන්ම සතුට ප්‍රකාශ කිරීම සඳහා ද සුබ පැතුම් පත් යැවීමේ සම්ප්‍රදායක් අද අප අතර පවතී. ජීවිතයේ වැදගත් අවස්ථා සේ ම සැමරුම්, ජයග්‍රහණ ප්‍රමුඛ ව විවිධ අරමුණු වෙනුවෙන් මේ සුබ පැතුම් පත් සකස් කෙරේ.


උපන් දිනය, විවාහය, විවාහ සංවත්සර, නව වසරට ආසිරි පැතීම, නත්තල, වෙසක් ආදි විශේෂ උත්සව සැමරීමට මෙන් ම විභාග, තරග ආදියෙන් ලත් ජයග්‍රහණ සහ තනතුරු උසස් වීම් වැනි අවස්ථාවල දී ශුභාශිංසනාත්මක පණිවුඩ යැවෙයි. තව ද, රැකියාවෙන් විශ්‍රාම යාම, විදේශගත වීම් පමණක් නොව රෝගී අවස්ථාවල දී ඉක්මන් සුවය පතා ද සෙත් පතා යැවෙන අවස්ථා බොහෝ ය. ඒ අනුව සුබ පැතුම් පත් සැකසීමේ දී සැලකිය යුතු විශේෂ කරුණු කවරේ දැයි බලමු.

★ සුබ පැතීමේ නිමිත්ත/ අදාළ කරුණ සඳහන් විය යුතුය.
★ සුබ පැතුම් පත මෙන් ම එහි ලියැවෙන සුබ පැතීමේ සටහන ද වඩාත් ආකර්ෂණීය භාෂා ශෛලියකින් නිර්මාණාත්මක ලෙස ගොනු කර ගැනීම වැදගත් ය.

- ★ එම සටහන සංක්ෂිප්ත විය යුතු අතර අතිශය හෘදයාංගම විය යුතු ම ය.
- ★ ඒ සඳහා යොදා ගනු ලබන භාෂා ශෛලිය යවන අය හා ලබන්නා අතර ඇති සම්බන්ධය අනුව ද වෙනස් විය හැකි ය.
- ★ කා විසින් කවුරුන් වෙත ද යන්න පැහැදිලි ව සඳහන් විය යුතු ය.

මේ අනුව ඔබට ලැබී ඇති විවිධ සුබ පැතුම් පත් කියවා බලන්න. පහත පෙන්වා දී ඇති ආදර්ශ ද සුබ පැතුම් පතක් සකස් කිරීමේ දී ඔබට මග පෙන්වීමක් වනු ඇත.

**නිදසුන්:-** අන්තර් විද්‍යාලයීය මලල ක්‍රීඩා තරගයෙන් ජය ලැබූ ඔබේ පන්තියේ ම මිතුරකුට ලියූ සුබ පැතුමක්



නැගණියන්ට යැවෙන උපන් දින සුබ පැතුමක්




### ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන අවස්ථා අතරින් දෙකක් තෝරා ඊට සුදුසු සුබ පැතුම් පත් සකස් කරන්න.
   - ★ ලෝක ගුරු දිනය වෙනුවෙන් පන්ති භාර ගුරුතුමියට
   - ★ රැකියාවෙන් විශ්‍රාම යන විදුහල්පතිතුමාට
   - ★ උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වන අයියාට
   - ★ නිරෝගි සුවය පතා තම මුත්තණුවන්ට
   - ★ 21 වෙනි උපන් දිනය සමරන වැඩිමහල් සොහොයුරියට

## පෞද්ගලික ලිපි

සන්නිවේදන තාක්ෂණය මේ තාක් දුරට ව්‍යාප්ත වීමට පෙර කලක් අතිශයින් ජනප්‍රිය ව තිබූ ලිපි ලිවීම එදිනෙදා ජීවිතයේ දී අදටත් අපට ප්‍රයෝජනවත් වේ. එහෙයින් පෞද්ගලික ලිපියක් යනු කුමක්දැයි යන්නත් ඒ ලිපි ලිවීමේ දී වැදගත් වන කරුණු කවරේදැයි යන්නත් සලකා බලමු.

තම පවුලේ අයෙකුට, හිත මිත්‍රාදීන්ට හෝ පෞද්ගලික ව දැන හඳුනා ගත්

අයට හෝ වෙනත් කවර පුද්ගලයකුට පෞද්ගලික මට්ටමින්/ පෞද්ගලික සම්බන්ධතා මත හෝ යවන ලිපි පෞද්ගලික ලිපි වේ.

⋆ පෞද්ගලික ලිපියක,

1. යවන්නාගේ ලිපිනය හා දිනය
2. ආශීර්වාදය
3. ආමන්ත්‍රණය
4. අන්තර්ගතය/ කරුණු
5. අවසානය

යන අංග ඇතුළත් විය යුතු ය.

පෞද්ගලික ලිපි ඒ ලිපිය හුවමාරු වන දෙදෙනාට උචිත වන සේ ආශීර්වාදය, ආමන්ත්‍රණය, අවසානය යෙදිය යුතුය. හිතවත් මිතුරකුට, වැඩිහිටියකුට, ප්‍රභූවරයකුට යවන ලිපිවල ඒ ඒ පුද්ගලයාට අනුව ඉහත දැක්වූ අංග තුන ද වෙනස් වන අයුරු විමසා බලන්න. ලිපියේ කරුණු විස්තරයේ හෙවත් අන්තර්ගතයේ භාෂා රටාව ද ලිපිය ලබන පුද්ගලයා හා යවන්නා අතර ඇති සම්බන්ධය අනුව වෙනස් වේ.

නිදසුනක් ලෙස ළඟ හිතමිතුරකුට, ඥාතියකුට ලියන අන්දමට වඩා සංයමයක් ඇති භාෂා රටාවක් අනුව ඔබේ ගුරුතුමාට හෝ වෙනත් ප්‍රභූවරයකුට ලියන අයුරු සිතන්න.

⋆ මිත්තණියන්කෙනෙකු සිය මුනුබුරාට ලැබුණු මේ ලිපිය කියවා බලන්න.

25/2 කන්දෙ ගෙදර,
වට රවුම් පාර,
පැල්මඩුල්ල,
2015.11.23.

සෙත් වේවා !

ආදරණීය සුදු පුතාට,

ඉස්කෝලේ නිවාඩු දෙන්න ළඟ නිසා මේ ලිපිය ලියන්නේ සතුටුදායක ආරංචියක් කියන්න. මේ අවුරුද්දෙ පුතාලව ශ්‍රී පාදෙ වඳින්න එක්ක යනවා. කියා මා පොරොන්දුවක් වුණා මතක ද? මද්දු නැන්දලා මේ නිවාඩුවේ මෙහෙ එන නිසා නුවර බාප්පලාටත් මෙහෙ ඇවිත් යන්න ඕනෑලු. ඉතින්, පුතාලා ආවොත් අපි හැමෝට ම ශ්‍රී පාදෙ කරුණා කරන්න පුළුවනි.
ඒ නිසා මේ නිවාඩුව ලැබුණු ගමන් ම අපි ගමනට පිටත් වෙමු. අපිට

ගමනට තුන් සරණේ කිය කියා හිමේ නගින්න පුළුවනි. සීත ගඟුලෙ නාලා, ඉර සේවෙත් බලලා ශ්‍රී පාදෙ වන්දනා කරමු.

මේ දවස්වල මෙහෙ හරි ම සීතලයි. කඳු යාය ම මීදුමෙන් වැහිලා බලන්න ලස්සනයි. පුතාලගේ ගමනට අඳින ඇඳුම් ගේන්න කියලා අම්මට කියන්න. තාත්තාටත් කලින් ම නිවාඩු ගන්න වේවිනෙ. ඒ නිසා අපි කල් ඇතිව සූදානම් වෙලා මේ ගමන යමු. ඉතින්, මගේ පුතාටත්, පුතාගේ අම්මාටත් තාත්තාටත් සමන් දෙවියන්ගේ පිහිටයි.

මේ

ආදරණීය අත්තම්මා

## ලිඛිත අභ්‍යාස

1. **මෙහි ඉහත දක්වා ඇති ලිපියට සුදුසු පිළිතුරු ලිපියක් හෝ ඔබ කැමති වෙනත් ප්‍රකට ආගමික සිද්ධස්ථානයක් කරා යෑමට ආරාධනා කරමින් ඔබේ මිත්තණියට ලිපියක් හෝ ලියන්න.**

   උදාහරණ :- අනුරාධපුරය/ මිහින්තලය/ මඩු දේවස්ථානය/ නල්ලූර් කෝවිල/ මුස්ලිම් දේවස්ථානය

2. **ඉහත ලිපියේ දැක්වෙන විරාම ලක්ෂණ මොනවා ද?**
3. **පහත දැක්වෙන අයට ලියන ලිපියකට සුදුසු ආමන්ත්‍රණ සහ අවසානය ලියා දක්වන්න.**
   - ★ මාමාට
   - ★ අම්මාට
   - ★ ගුරුතුමියට
   - ★ මිතුරකුට
   - ★ පාසැලේ විදුහල්පතිතුමාට
4. **මේ අවස්ථාවලින් එකක් තෝරා ලිපියක් ලියන්න.**
   - ★ පාසැලෙන් දුර බැහැර ප්‍රදේශයකට මාරුවක් ලබා ගිය ඔබේ සිංහල ගුරුතුමියට
   - ★ පාසලේ පැවැත්වුණු තෑගි දීමේ උත්සවය ගැන විස්තර කරමින් වෙනත් පාසලකට අස් ව ගිය මිතුරෙකුට
   - ★ ඔබේ පාසලේ පැවැත්වෙන වාර්ෂික චිත්‍ර හා මූර්ති ප්‍රදර්ශනය නැරඹීම ට පැමිණෙන්නැයි මිතුරෙකුට
   - ★ ඔබේ ප්‍රියතම රූපවාහිනී ළමා වැඩසටහන මෙහෙයවන නිවේදක මහතාට හෝ මහත්මියට